# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2023 පෙබරවාරි 28 |



## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2023 ජනවාරි

### සුවිශේෂී කරුණු

- වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය, පෙර වසරට සාපේක්ෂව 2023 වසරේ ජනවාරි මාසයේ දී පහළ ගියේය.
- පසුගිය වසරට සාපේක්ෂව 2023 වසරේ ජනවාරි මාසයේ දී ආනයන වියදම පහළ මට්ටමක පැවති අතර, අපනයන ආදායම පහළ ගියේය.
- 2023 වසරේ ජනවාරි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ සංචාරක ඉපැයීම් අඛණ්ඩව ඉහළ ගියේය.
- 2023 වසරේ ජනවාරි මාසය අවසන් වන විට දළ නිල සංචිත ශක්තිමත් වූ අතර, 2023 වසරේ ජනවාරි මාසයේ දී විනිමය අනුපාතිකය ස්ථාවරව පැවතුණි.
- 2023 වසරේ ජනවාරි මාසයේ දී කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත විදේශ ආයෝජනයන්හි සුළු ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ වෙතින් විදේශ ආයෝජනයන්හි සුළු ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.

### වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය

#### අපනයන









| වෙළඳ හිඟය | ජනවාරි |
|---|---|
| 2022 | එ.ජ.ඩො. බිලියන 0.9 |
| 2023 | එ.ජ.ඩො. බිලියන 0.4 |


#### ආනයන





### සංචාරක ඉපැයීම්




### විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ (එ.ජ.ඩො. මිලියන )





### දළ නිල සංචිත*





* චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වේ.

### කොළඹ කොටස් වෙළඳපොළ වෙත ශුද්ධ ලැබීම්


(ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ - ශුද්ධ)




### රජය වෙත දළ ලැබීම්





### විනිමය අනුපාතිකයේ වෙනස්වීම් (එ.ජ. ඩොලරයට රුපියල්)



## වෙළඳ භාණ්ඩ ගිණුමේ ශේෂය


වෙළඳ ගිණුමේ හිඟය, අපනයන පහළ යෑමට සාපේක්ෂව ආනයන විශාල වශයෙන් පහළ යෑම හේතුවෙන් 2022 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 857 සිට 2023 වසරේ ජනවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 410ක් දක්වා පහළ ගියේය. කෙසේ වෙතත්, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 358ට සාපේක්ෂව 2023 වසරේ ජනවාරි මාසයේ දී වෙළඳ ගිණුමේ හිඟය පුළුල් විය. වෙළඳ ගිණුමේ හිඟයේ වෙනස් වීම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 1 මගින් දැක්වේ.

**රූප සටහන 1: 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ ජනවාරි මාසය තුළ වෙළඳ හිඟය වෙනස් වීම සඳහා දායක වූ ප්‍රධාන අයිතම** (එ.ජ. ඩොලර් මිලියන)




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ ශේෂය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය[1]

**සමස්ත අපනයන: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම, 2022 සැප්තැම්බර් මාසයේ සිට, අපේක්ෂිත මට්ටමට වඩා මන්දගාමී වේගයකින් වුවද, අඛණ්ඩව පහළ යෑමක් පෙන්නුම් කරමින්, 2023 වසරේ ජනවාරි මාසයේ දී 2022 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 978ක් දක්වා සියයට 11.3කින් පහළ ගියේය**. සියලුම ප්‍රධාන අපනයන කාණ්ඩවල ඉපැයීම් පහළ ගිය අතර, ඒ අතරින් කාර්මික අපනයන පහළ යෑම කැපී පෙනුණි.


**කාර්මික අපනයන:** 2023 වසරේ ජනවාරි මාසයේ දී කාර්මික භාණ්ඩ අපනයනයෙන් ලද ආදායම, 2022 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව පහළ ගිය අතර, මෙම සමස්ත පහළ යෑම සඳහා බොහෝ ප්‍රධාන වෙළඳපොළ (ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය සහ එක්සත් රාජධානිය) තුළ පැවති ඉල්ලුම පහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස ඇඟලුම් අපනයන විශාල වශයෙන් පහළ යෑම හේතු විය. මේ අතර, නැව් සඳහා සපයන ලද ඉන්ධන මිල ගණන් ඉහළ ගිය ද, නැව් සහ ගුවන්යානා සඳහා සපයන ලද ඉන්ධන පරිමාවන් පහළ යෑම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම පහළ ගියේය. තවද, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ; සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ (ප්‍රධාන වශයෙන්, ඉලෙක්ට්‍රොනික උපකරණ) අපනයන ආදායම ඉහළ ගිය ද, රබර් නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, ගෘහස්ථ රබර් අත්වැසුම්) අපනයන පහළ යෑමේ ප්‍රවණතාවය අඛණ්ඩව පැවතුණි.

[1] අපනයන සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වර්ගීකරණය සහ සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයේ සිව්වන සංස්කරණය පදනම් කර ගත් අපනයන සංයුතිය, පිළිවෙළින්, ඇමුණුම II සහ ඇමුණුම IIIහි දක්වා ඇත.

**කෘෂිකාර්මික අපනයන:** පොල් ආශ්‍රිත නිෂ්පාදිත යටතේ වර්ගීකරණය කරන ලද පොල් කෙඳි සහ දිසිදි පොල් අපනයන ප්‍රමාණය පහළ යෑම හේතුවෙන් කෘෂිකාර්මික භාණ්ඩ අපනයන ආදායම පෙර වසරට සාපේක්ෂව 2023 වසරේ ජනවාරි මාසයේ දී පහළ ගියේය. කෙසේ වෙතත්, තේ අපනයන පරිමා පහළ ගියද, තේ අපනයන මිල ගණන්වල සාමාන්‍යය ඉහළ යෑමත් සමඟ තේ අපනයන ආදායම වර්ධනය විය. 2021/2022 කාලපරිච්ඡේදය තුළ ප්‍රමාණවත් පරිදි පොහොර නොලැබීමේ පසු බලපෑම හේතුවෙන් කෘෂිකාර්මික අපනයන සියල්ලම පාහේ පරිමාව සාමාන්‍යයෙන් පහළ මට්ටමක පැවතුණි.


**ඛනිජමය අපනයන:** ප්‍රධාන වශයෙන් ක්වාට්ස් සහ ස්වභාවික මිනිරන් කුඩු අපනයනය පහළ යෑම හේතුවෙන්, 2023 වසරේ ජනවාරි මාසයේ දී ඛනිජමය අපනයන ආදායම, 2022 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව පහළ ගියේය.

**රූප සටහන 3: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 4: අපනයන සංයුතිය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය[2]

**සමස්ත ආනයන: වෙළඳ භාණ්ඩ ආනයන වියදම 2023 වසරේ ජනවාරි මාසයේ දී පහළ මට්ටමක පැවතුණි.** මේ අනුව, ආනයන වියදම, 2022 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,959ට සහ 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,426ට සාපේක්ෂව 2023 වසරේ ජනවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,388ක් දක්වා සියයට 29.2කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) පහළ ගියේය. සියලුම අංශවල ආනයන වියදම පහළ යෑම මෙම අඩුවීම සඳහා හේතු වූ අතර අන්තර් භාණ්ඩ ආනයන වියදම පහළ යෑම වැඩිම දායකත්වයක් දැක්විය.


[2] ආනයන සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වර්ගීකරණය සහ සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය සිව්වන සංස්කරණය පදනම් කර ගත් ආනයන සංයුතිය, පිළිවෙළින්, ඇමුණුම IV සහ ඇමුණුම V හි දක්වා ඇත.

**පාරිභෝගික භාණ්ඩ:** 2023 වසරේ ජනවාරි මාසයේ දී ආහාර සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ යන දෙඅංශයෙහිම ආනයන වියදම පහළ යෑම හේතුවෙන් 2022 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය. ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම් පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදිත ආනයන පහළ යෑම (2022 වසරේ ජනවාරි මාසයේ දී කොවිඩ් එන්නත් සඳහා සිදු කළ විශාල වියදම්හි පදනම් බලපෑම මත) හේතු විය. ආහාර සහ පාන වර්ග සඳහා වන ආනයන වියදම ද, 2022 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව පහළ ගිය අතර, ඒ සඳහා ධාන්‍ය වර්ග සහ ඇඹරුම් කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, සහල්) ආනයන පහළ යෑම හේතු විය.

**අන්තර් භාණ්ඩ:** 2023 වසරේ ජනවාරි මාසයේ දී රෙදිපිළි සහ රෙදිපිළි උපාංග (මූලික වශයෙන්, රෙදි වර්ග) ආනයන පහළ යෑම හේතුවෙන් අන්තර් භාණ්ඩ ආනයන වියදම වසරකට පෙර පැවති අගයට සාපේක්ෂව පහළ ගිය අතර, එමගින් ඉදිරි කාලයේ දී  ඇඟලුම් අපනයනය පහළ යෑමක් පෙන්නුම් කරයි. තවද, මූල ලෝහ (මූලික වශයෙන්, යකඩ සහ වානේ), ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ තිරිඟු ආනයනයෙහි සැලකිය යුතු පහළ යෑමක් වාර්තා විය. මීට ප්‍රතිවිරුද්ධව, 2022 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයනය සඳහා වන වියදම (පරිමාවන් අඩු වීම හේතුවෙන්) පහළ ගිය ද, බොරතෙල් සහ ගල් අඟුරු ආනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් මෙම කාණ්ඩය යටතේ විශාලතම ආනයන සංරචකය වන ඉන්ධන ආනයන වියදම ඉහළ ගියේය.


**ආයෝජන භාණ්ඩ:** 2022 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව 2023 වසරේ ජනවාරි මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය. ප්‍රධාන ආයෝජන භාණ්ඩ උපකාණ්ඩ තුන යටතේ ලැයිස්තුගත කර ඇති සියලුම වර්ගවල භාණ්ඩ, එනම් යන්ත්‍රසූත්‍ර සහ උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ පහළ යෑමක් වාර්තා කළේය.

**රූප සටහන 5: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 6: ආනයන සංයුතිය**





**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ දර්ශක

අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය, 2022 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව 2023 වසරේ ජනවාරි මාසයේ දී සියයට 3.1කින් ඉහළ ගිය අතර, අපනයන මිල ගණන් පහළ යෑමට වඩා වැඩි වේගයකින් ආනයන මිල ගණන් පහළ යෑම මේ සඳහා හේතු විය.


**රූප සටහන 7: වෙළඳ මිල අනුපාතය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

අපනයන ආදායම පහළ යෑම සඳහා අපනයන මිල ගණන් පහළ යෑම හේතු වූ බව නිරූපණය කරමින්, 2023 වසරේ ජනවාරි මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අපනයන පරිමා දර්ශකය සියයට 5.3කින් ඉහළ ගිය අතර, අපනයන ඒකක මිල දර්ශකය සියයට 15.7කින් පහළ ගියේය.


**රූප සටහන 8: අපනයන පරිමා හා ඒකක මිල දර්ශක**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

ආනයන වියදම පහළ යෑම සඳහා ආනයන පරිමාව සහ ඒකක මිල බලපෑම හේතු වූ බව නිරූපණය කරමින්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආනයන පරිමා දර්ශකය සහ ආනයන ඒකක මිල දර්ශකය, පිළිවෙළින් සියයට 13.3කින් සහ සියයට 18.3කින් පහළ ගියේය.

**රූප සටහන 9: ආනයන පරිමා සහ ඒකක මිල දර්ශක**





**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## විදේශීය ජංගම ගිණුමේ වාර්තා වූ අනෙකුත් ප්‍රධාන වර්ධනයන්

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ:** පෙර වසරේ අනුරූප මාසය තුළ වූ එ.ජ. ඩොලර් මිලියන 259ට සාපේක්ෂව 2023 වසරේ ජනවාරි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 437ක් ලෙස යථා තත්ත්වයට පත් විය. මේ අතර, 2023 වසරේ ජනවාරි මාසය තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව යෑමේ සමස්තය 24,236ක් ලෙස වාර්තා වූ අතර එය නුපුහුණු (7,556), පුහුණු (7,283) සහ ගෘහ සේවිකා (6,120) යන කාණ්ඩවලින් සමන්විත විය.


**සංචාරක පැමිණීම්:** 2022 වසරේ දෙසැම්බර් මාසයේ වාර්තා වූ 91,961ට සහ 2022 වසරේ ජනවාරි මාසයේ වාර්තා වූ 82,327ට සාපේක්ෂව සංචාරක පැමිණීම් ප්‍රමාණය 2023 වසරේ ජනවාරි මාසයේ දී 102,545ක් දක්වා ඉහළ ගියේය. 2023 වසරේ ජනවාරි මාසය තුළ වැඩිම සංචාරක පැමිණීම් ප්‍රමාණයක් වාර්තා වූ රටවල් ලෙස රුසියාව, ඉන්දියාව, එක්සත් රාජධානිය, ජර්මනිය, සහ ඕස්ට්‍රේලියාව පැවතුණි. 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 127ක් සහ පෙර වසරේ ජනවාරි මාසය තුළ වූ එ.ජ. ඩොලර් මිලියන 152ට සාපේක්ෂව, 2023 වසරේ ජනවාරි මාසයේ දී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 162ක්[3] ලෙස ඇස්තමේන්තු කර ඇත.

**රූප සටහන 11: මාසික සංචාරක පැමිණීම්**




**මූලය:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 12: සංචාරක ඉපැයීම්[3] සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




**මූලයන්:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

---

[3] තාවකාලික


## මූලය ලැබීම්

2023 වසරේ ජනවාරි මාසය තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 0.4ක විදේශ ආයෝජනවල සුළු ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. මේ අතර, ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව, 2023 වසරේ ජනවාරි මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත එ.ජ. ඩොලර් මිලියන 1ක සුළු ශුද්ධ විදේශ ලැබීමක් ලැබීමක් වාර්තා විය.

## ජාත්‍යන්තර සංචිත

2023 වසරේ ජනවාරි මාසය අවසන් වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 2.1ක් විය. චීන මහජන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් බිලියන 1.4කට සමාන විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වූ අතර, එය භාවිතා කිරීම යම් කොන්දේසි වලට යටත් වේ. මහ බැංකුව 2023 වසරේ ජනවාරි මස වෙළඳපළෙන් විදේශ විනිමය ශුද්ධ අවශෝෂණයක් වාර්තා කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2023 වසරේ ජනවාරි මාසය අවසන් වන විට ද්‍රවශීලී සංචිතවල සුළු වර්ධනයක් වාර්තා කළේය.

**රූප සටහන 13: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**





**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව


## විනිමය අනුපාතිකයෙහි හැසිරීම

**සුළු අතිප්‍රමාණය වීමක් සහිතව, 2023 වසරේ ජනවාරි මාසයේ දී විනිමය අනුපාතිකය අඛණ්ඩව ස්ථාවරව පැවතුණි.** මේ අතර, 2023 වසරේ පෙබරවාරි මස 28වන දින දක්වා කාලය තුළ, ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව 0.4ක අතිප්‍රමාණය වීමක් වාර්තා කර ඇත. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් වල හැසිරීම පිළිබිඹු කරමින්, 2023 වසරේ පෙබරවාරි මස 28වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල යුරෝ, ස්ටර්ලින් පවුම, ජපන් යෙන්, ඉන්දියානු රුපියල, සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට සාපේක්ෂව අතිප්‍රමාණය විය. මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) 2022 වසරේ ජනවාරි මාසය තුළ දී සුළු වශයෙන් අවප්‍රමාණය වූ අතර, ශ්‍රී ලංකා රුපියලෙහි විදේශීය තරඟකාරීත්වයෙහි වර්ධනයක් පෙන්නුම් කරමින් දර්ශක අංක 100යේ සීමාවට වඩා බොහෝ දුරට පහළ මට්ටමක පැවතුණි.

**රූප සටහන 14: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස් වීම**




**රූප සටහන 15: මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකයෙහි වෙනස්වීම**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස් වීම***

| මුදල් ඒකකය | 2021 | 2022 | 2023 (පෙබරවාරි 28 දක්වා) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -7.0% | -44.8% | +0.4% |
| යුරෝ | +1.1% | -41.4% | +1.0% |
| ස්ටර්ලින් පවුම | -6.0% | -38.1% | +0.3% |
| ජපන් යෙන් | +3.8% | -36.4% | +3.1% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -1.2% | -40.8% | +0.7% |
| ඉන්දියානු රුපියල | -5.5% | -38.6% | +0.3% |

* අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+)

**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**2023 වසරේ පෙබරවාරි මාසය සඳහා වන විදේශීය අංශයේ පුවත්පත් නිවේදනය 2023 වසරේ මාර්තු මස 31වන දින නිකුත් කරනු ඇත.**

**ඇමුණුම I :**

**වෙළඳ අංශයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සාරාංශය (අ)**

| **කාණ්ඩය** | **2021 එ.ජ.ඩො. මිලියන** | **2022 එ.ජ.ඩො. මිලියන** | **වෙනස (%)** | **2022 ජනවාරි එ.ජ.ඩො. මිලියන** | **2023 ජනවාරි එ.ජ.ඩො. මිලියන** | **වෙනස (%)** |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 12,499 | 13,106 | 4.9 | 1,103 | 978 | -11.3 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 20,637 | 18,291 | -11.4 | 1,959 | 1,388 | -29.2 |
| වෙළඳ ශේෂය | -8,139 | -5,185 | | -857 | -410 | |
| සංචාරක ඉපැයීම් | 507 | 1,136 (ආ) | - | 152 (ආ) | 1,62 (ඇ) | - |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 5,491 | 3,782 (ඈ) | -31.1 | 259 | 437 | 68.8 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඉ) | -238 | 182 | | 36 | 1 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 2,435 | 2,401 | | 135 | 3 (ඊ) | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 17 | 69 | | 5 | 3 | |
| දිගුකාලීන ණය | 1,608 | 2,333 | | 129 | ලැ.නො. | |
| ඒකාබද්ධ ණය පහසුකම | 810 | - | | - | - | |
| සමස්ත ශේෂය | -3,967 | -2,806 (ඈ) | | -1,408 | 211 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) 2022 වසරේ දී සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවත්වනු ලැබූ සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව සංශෝධනය කරන ලදී.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2023 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) සංශෝධිත
(ඉ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත් වේ
(ඊ) දිගු කාලීන ණය සඳහා ඇතුළත් විදේශීය ණය දත්ත 2023 ජනවාරි මාසය සඳහා ලැබී නොමැත

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරීත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් ‘මාසික වෙළඳ විවරණිකාව’ ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

**ඇමුණුම II: ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයට අනුව වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | 2021 (එ.ජ.ඩො. මිලියන) | 2022 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2022 ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | 2023 ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **9,702.1** | **10,465.3** | **7.9** | **891.9** | **781.3** | **-12.4** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 586.9 | 519.5 | -11.5 | 41.7 | 34.7 | -16.7 |
| සත්ත්ව ආහාර | 149.4 | 170.5 | 14.1 | 12.8 | 16.2 | 26.0 |
| රෙදිපිළි හා ඇඟලුම් | 5,435.1 | 5,952.0 | 9.5 | 516.1 | 424.4 | -17.8 |
| එයින්, ඇඟලුම් | 4,951.5 | 5,483.1 | 10.7 | 478.9 | 388.9 | -18.8 |
| රෙදිපිළි | 355.4 | 353.7 | -0.5 | 27.7 | 27.4 | -1.2 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 128.1 | 115.2 | -10.1 | 9.4 | 8.1 | -14.6 |
| රබර් නිෂ්පාදිත | 1,050.4 | 977.0 | -7.0 | 82.0 | 72.7 | -11.4 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 276.8 | 450.6 | 62.8 | 31.9 | 54.1 | 69.6 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 500.9 | 580.9 | 16.0 | 44.6 | 50.8 | 13.7 |
| ප්‍රවාහන උපකරණ | 148.2 | 129.3 | -12.8 | 8.9 | 5.7 | -35.8 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 506.4 | 568.0 | 12.2 | 67.2 | 46.4 | -30.9 |
| රසායනික නිෂ්පාදිත | 223.2 | 223.5 | 0.1 | 17.9 | 12.7 | -28.9 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 129.9 | 136.9 | 5.4 | 11.7 | 9.7 | -16.9 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 50.0 | 53.1 | 6.1 | 4.2 | 7.6 | 79.8 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 58.4 | 85.8 | 46.9 | 4.3 | 5.2 | 23.1 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 78.6 | 60.9 | -22.5 | 6.3 | 4.1 | -33.8 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 156.4 | 176.7 | 13.0 | 14.2 | 10.3 | -27.7 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 37.4 | 38.1 | 1.8 | 2.6 | 3.0 | 17.3 |
| වෙනත් කාර්මික අපනයන | 314.1 | 342.4 | 9.0 | 25.6 | 23.6 | -7.8 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **2,729.5** | **2,568.0** | **-5.9** | **204.5** | **191.0** | **-6.6** |
| තේ | 1,324.4 | 1,258.8 | -5.0 | 91.2 | 99.6 | 9.1 |
| රබර් | 42.2 | 41.4 | -1.8 | 5.1 | 3.2 | -37.2 |
| පොල් | 425.2 | 400.3 | -5.9 | 33.3 | 22.0 | -34.1 |
| කුළුබඩු | 454.8 | 368.7 | -18.9 | 35.0 | 34.1 | -2.7 |
| එළවළු | 28.5 | 26.7 | -6.6 | 2.2 | 2.4 | 5.9 |
| සකස් නොකළ දුම්කොළ | 31.6 | 24.4 | -22.8 | 2.3 | 0.7 | -67.3 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 148.8 | 178.8 | 20.2 | 11.2 | 8.1 | -27.9 |
| මුහුදු ආහාර | 274.1 | 269.0 | -1.8 | 24.1 | 20.9 | -13.1 |
| **3. ඛනිජ අපනයන** | **44.5** | **50.0** | **12.3** | **4.3** | **3.6** | **-15.8** |
| **4. වර්ග නොකළ අපනයන** | **22.5** | **23.2** | **3.2** | **1.8** | **2.3** | **26.1** |
| **මුළු අපනයන** | **12,498.6** | **13,106.4** | **4.9** | **1,102.6** | **978.2** | **-11.3** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

**ඇමුණුම III:**

## සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව අපනයන සංයුතිය (අ)

| කාණ්ඩය | 2021 (එ.ජ.ඩො. මිලියන) | 2022 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2022 ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | 2023 ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **2,846.0** | **2,701.8** | **-5.1** | **215.8** | **209.2** | **-3.1** |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 316.0 | 301.2 | -4.7 | 27.2 | 23.8 | -12.5 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 71.8 | 77.5 | 7.9 | 5.8 | 5.9 | 1.8 |
| 05 එළවළු හා පලතුරු | 468.2 | 449.0 | -4.1 | 39.1 | 25.6 | -34.4 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 1,742.9 | 1,611.1 | -7.6 | 125.8 | 133.3 | 5.9 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **145.2** | **135.8** | **-6.5** | **8.7** | **9.5** | **9.7** |
| 11 පාන වර්ග | 33.3 | 46.7 | 40.2 | 2.4 | 4.0 | 68.8 |
| 12 දුම්කොළ හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදිත | 112.0 | 89.2 | -20.4 | 6.3 | 5.5 | -12.6 |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **433.2** | **450.3** | **3.9** | **38.0** | **32.4** | **-14.8** |
| 23 සකස් නොකළ රබර් | 43.1 | 42.4 | -1.5 | 5.2 | 3.3 | -36.1 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 240.3 | 228.6 | -4.9 | 18.7 | 17.2 | -8.3 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **506.4** | **568.0** | **12.2** | **67.2** | **46.4** | **-30.9** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 462.9 | 544.1 | 17.5 | 51.3 | 46.4 | -9.5 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 43.5 | 23.9 | -44.9 | 15.9 | - | - |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **128.9** | **89.9** | **-30.3** | **6.8** | **4.0** | **-41.6** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 86.1 | 75.4 | -12.4 | 5.6 | 3.9 | -30.5 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **291.7** | **271.5** | **-6.9** | **20.8** | **15.8** | **-23.9** |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **1,700.7** | **1,876.0** | **10.3** | **145.7** | **155.5** | **6.7** |
| 62 රබර් නිෂ්පාදන (අන් තැනක සඳහන් නොවන) | 684.5 | 680.3 | -0.6 | 53.8 | 51.9 | -3.4 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 458.4 | 447.1 | -2.5 | 36.2 | 30.3 | -16.4 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 335.1 | 510.5 | 52.3 | 36.1 | 58.6 | 62.4 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **631.8** | **692.1** | **9.5** | **52.2** | **55.3** | **6.0** |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් (අන් තැනක සඳහන් නොවන) | 318.4 | 364.2 | 14.4 | 27.4 | 30.8 | 12.5 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **5,813.1** | **6,320.3** | **8.7** | **547.3** | **450.0** | **-17.6** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 5,360.0 | 5,832.0 | 8.8 | 510.7 | 412.6 | -19.2 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **1.5** | **0.8** | **-47.7** | **...** | **...** | **-** |
| **මුළු අපනයන** | **12,498.6** | **13,106.4** | **4.9** | **1,102.6** | **978.2** | **-11.3** |

(අ) තාවකාලික

... සැලකිය යුතු නොවේ

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017 හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

**ඇමුණුම IV:**

## ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයට අනුව වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| භාණ්ඩය | 2021 (එ.ජ.ඩො. මිලියන) | 2022 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2022 ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | 2023 ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **3,848.7** | **2,813.0** | **-26.9** | **360.0** | **218.5** | **-39.3** |
| ආහාර හා පාන වර්ග | 1,666.5 | 1,607.9 | -3.5 | 187.2 | 118.3 | -36.8 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 97.4 | 430.5 | 342.3 | 60.5 | 15.3 | -74.7 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 317.7 | 225.3 | -29.1 | 29.9 | 16.2 | -45.8 |
| එළවළු (ආ) | 384.3 | 318.4 | -17.1 | 29.6 | 24.1 | -18.5 |
| මුහුදු ආහාර | 122.3 | 66.4 | -45.7 | 8.5 | 3.6 | -57.5 |
| සීනි හා රසකැවිලි | 288.8 | 257.8 | -10.7 | 26.0 | 32.8 | 25.9 |
| කුළුබඩු | 127.2 | 136.6 | 7.4 | 11.9 | 9.9 | -16.5 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 328.8 | 172.8 | -47.4 | 20.8 | 16.4 | -21.0 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 2,182.2 | 1,205.1 | -44.8 | 172.8 | 100.2 | -42.0 |
| පෞද්ගලික රථවාහන | 12.8 | 11.7 | -8.5 | 0.7 | 1.5 | 121.0 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 882.5 | 533.4 | -39.6 | 78.9 | 51.0 | -35.4 |
| ගෘහ උපකරණ | 257.1 | 85.5 | -66.7 | 16.3 | 4.2 | -73.9 |
| රෙදිපිළි හා උපාංග | 221.3 | 215.6 | -2.6 | 22.9 | 18.2 | -20.3 |
| විදුලි සංදේශ උපකරණ | 382.9 | 69.0 | -82.0 | 16.7 | 3.7 | -78.1 |
| ගෘහ හා දැව භාණ්ඩ | 161.2 | 116.3 | -27.9 | 15.3 | 7.0 | -54.4 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 264.4 | 173.7 | -34.3 | 22.0 | 14.5 | -34.1 |
| **2. අන්තර් භාණ්ඩ** | **12,308.9** | **12,438.8** | **1.1** | **1,212.5** | **970.5** | **-20.0** |
| ඉන්ධන | 3,742.9 | 4,896.8 | 30.8 | 430.3 | 481.1 | 11.8 |
| එයින්, බොරතෙල් (ඇ) | 625.1 | 483.8 | -22.6 | 58.5 | 107.6 | 83.9 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 2,840.0 | 4,048.2 | 42.5 | 311.2 | 287.1 | -7.7 |
| ගල්අඟුරු | 277.8 | 364.8 | 31.3 | 60.6 | 86.4 | 42.7 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 143.6 | 203.8 | 41.9 | 14.0 | 21.2 | 51.3 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 3,066.9 | 3,065.2 | -0.1 | 316.5 | 217.5 | -31.3 |
| කඩදාසි හා ඝන කඩදාසි | 468.9 | 465.9 | -0.6 | 41.3 | 37.0 | -10.5 |
| කෘෂිකාර්මික යෙදවුම් | 264.2 | 214.5 | -18.8 | 17.0 | 22.3 | 31.4 |
| තිරිඟු හා ඉරිඟු | 418.3 | 303.1 | -27.5 | 41.7 | 5.6 | -86.7 |
| මූල ලෝහ | 866.4 | 323.2 | -62.7 | 74.8 | 13.1 | -82.5 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 765.7 | 650.8 | -15.0 | 77.1 | 37.4 | -51.5 |
| රසායනික නිෂ්පාදිත | 1,074.4 | 966.2 | -10.1 | 86.9 | 60.5 | -30.3 |
| පොහොර | 158.2 | 275.9 | 74.4 | 2.5 | 9.6 | 285.6 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 400.7 | 334.7 | -16.5 | 33.8 | 14.2 | -57.9 |
| ඛනිජ නිෂ්පාදිත | 158.9 | 123.7 | -22.1 | 16.5 | 5.6 | -66.1 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 779.7 | 615.0 | -21.1 | 60.0 | 45.4 | -24.3 |
| **3. ආයෝජන භාණ්ඩ** | **4,462.7** | **3,030.5** | **-32.1** | **386.7** | **198.9** | **-48.6** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 2,809.5 | 1,969.0 | -29.9 | 243.8 | 132.6 | -45.6 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,248.9 | 926.3 | -25.8 | 124.0 | 63.1 | -49.1 |
| ප්‍රවාහන උපකරණ | 398.5 | 132.1 | -66.8 | 18.7 | 2.7 | -85.4 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 5.8 | 3.0 | -47.9 | 0.2 | 0.4 | 58.8 |
| **4. වර්ග නොකළ ආනයන** | **17.1** | **8.8** | **-48.8** | **0.1** | **0.1** | **-37.2** |
| **මුළු ආනයන** | **20,637.4** | **18,291.0** | **-11.4** | **1,959.4** | **1,387.9** | **-29.2** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **16,894.6** | **13,394.2** | **-20.7** | **1,529.1** | **906.8** | **-40.7** |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.
(ඇ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ දත්ත නොලැබීම හේතුවෙන් බොරතෙල් අගයන් රේගු දත්ත මත පදනම් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

**ඇමුණුම V:**

**සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව ආනයන සංයුතිය (අ)**

| කාණ්ඩය | 2021 (එ.ජ.ඩො. මිලියන) | 2022 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2022 ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | 2023 ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **2,275.2** | **2,162.2** | **-5.0** | **248.7** | **145.2** | **-41.6** |
| 02 කිරි ආශ්‍රිත නිෂ්පාදිත හා කුරුලු බිත්තර | 318.1 | 225.7 | -29.1 | 30.0 | 16.2 | -45.9 |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 123.6 | 67.7 | -45.2 | 8.6 | 3.7 | -57.3 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 513.0 | 729.0 | 42.1 | 102.0 | 20.6 | -79.8 |
| 05 එළවළු හා පලතුරු | 457.7 | 365.4 | -20.2 | 36.3 | 27.1 | -25.5 |
| 06 සීනි, සීනි ආශ්‍රිත සැකසුම් හා පැණි | 288.9 | 257.8 | -10.7 | 26.0 | 32.8 | 25.9 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 169.5 | 180.0 | 6.2 | 16.5 | 13.4 | -18.9 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **76.8** | **101.0** | **31.5** | **7.8** | **11.6** | **49.1377** |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **584.7** | **465.3** | **-20.4** | **49.0** | **25.8** | **-47.4** |
| 23 සකස් නොකළ රබර් | 351.0 | 283.6 | -19.2 | 28.2 | 10.3 | -63.6 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 25.0 | 30.5 | 22.2 | 1.8 | 3.8 | 114.0 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය (ආ)** | **3,742.9** | **4,896.8** | **30.8** | **430.3** | **481.1** | **11.8** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 3,118.4 | 4,288.0 | 37.5 | 337.4 | 360.9 | 6.9 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 346.6 | 243.9 | -29.6 | 32.3 | 33.8 | 4.7 |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **285.2** | **79.8** | **-72.0** | **7.8** | **5.0** | **-36.8** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 262.3 | 65.6 | -75.0 | 5.7 | 4.0 | -29.5 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **2,847.9** | **2,392.2** | **-16.0** | **246.8** | **158.3** | **-35.9** |
| 54 බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 823.1 | 502.3 | -39.0 | 75.4 | 47.5 | -37.0 |
| 56 පොහොර | 157.6 | 275.8 | 74.9 | 2.5 | 9.6 | 285.8 |
| 57 ප්‍රාථමික ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 561.2 | 438.6 | -21.8 | 57.5 | 21.7 | -62.3 |
| 58 ප්‍රාථමික නොවන ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 173.3 | 174.7 | 0.8 | 18.7 | 13.4 | -28.6 |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **5,976.8** | **5,114.1** | **-14.4** | **587.5** | **356.1** | **-39.4** |
| 64 කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 442.0 | 436.7 | -1.2 | 37.5 | 36.2 | -3.5 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 3,007.8 | 2,991.0 | -0.6 | 308.5 | 209.5 | -32.1 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 525.2 | 485.0 | -7.7 | 55.0 | 38.7 | -29.7 |
| 67 යකඩ හා වානේ | 1,071.4 | 456.3 | -57.4 | 96.3 | 22.2 | -76.9 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **3,876.2** | **2,278.1** | **-41.2** | **294.5** | **146.3** | **-50.3** |
| 72 ඇතැම් කර්මාන්ත සඳහා විශේෂයෙන් සකස් කරන ලද යන්ත්‍රසූත්‍ර | 652.0 | 396.5 | -39.2 | 56.6 | 18.9 | -66.5 |
| 74 සාමාන්‍ය කාර්මික යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ යන්ත්‍ර කොටස් (අන් තැනක සඳහන් නොවන) | 599.2 | 430.9 | -28.1 | 46.1 | 27.7 | -39.8 |
| 75 කාර්යාලයීය යන්ත්‍රසූත්‍ර හා ස්වයංක්‍රීය දත්ත සැකසුම් යන්ත්‍ර | 354.6 | 161.7 | -54.4 | 29.0 | 10.9 | -62.6 |
| 76 විදුලි සන්දේශ සහ ශබ්ද පටිගත කිරීම හා ප්‍රතිනිෂ්පාදන කටයුතු සඳහා යොදාගනු ලබන උපකරණ | 785.3 | 231.6 | -70.5 | 38.6 | 13.7 | -64.6 |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග (අන් තැනක සඳහන් නොවන) සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් | 750.2 | 633.1 | -15.6 | 62.2 | 43.2 | -30.5 |
| 78 රථවාහන | 327.8 | 158.2 | -51.7 | 20.9 | 9.5 | -54.5 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **953.3** | **791.3** | **-17.0** | **86.5** | **58.3** | **-28.3** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 190.0 | 191.5 | 0.8 | 19.4 | 16.5 | -14.8 |
| 87 වෘත්තීමය, විද්‍යාත්මක හා පාලන මෙවලම් සහ උපකරණ (අන් තැනක සඳහන් නොවන) | 237.7 | 143.2 | -39.7 | 15.7 | 10.6 | -32.4 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **18.4** | **10.3** | **-44.3** | **0.4** | **0.2** | **-37.4** |
| **මුළු ආනයන** | **20,637.4** | **18,291.0** | **-11.4** | **1,959.4** | **1,387.9** | **-29.2** |

(අ) තාවකාලික

(ආ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ දත්ත නොලැබීම හේතුවෙන් බොරතෙල් අගයන් රේගු දත්ත මත පදනම් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017හි විශේෂ සටහන 04 බලන්න.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf